


# හෙරණගත්කරණී

එච්.එම්.ඩී.එන්.චමෝදි හේරත්

# හෙරණගත්කරණී

එච්.එම්.ඩී.එන්.චමෝදි හේරත්

# ... හෙරණගත්කරණී ...

එච්.එම්.ඩී.එන්.චමෝදි හේරත්

(සියලුම හිමිකම් ඇවිරිණි.)

වෙනත් කෘති-:

කාලය

තිබෙත් මහත් සාහිත රන වටින ලද

කෘතිය පළ කර දිනය -: 2025/02/08

ISBN අංකය -:  978-624-208-534-0

## ... පිදුම...

පොතට, සාහිතට , පබැඳුමට

පෙම් කරන සැම දන හට

පුදමි මේ පොත සතුටින,

තුටු පඬුරු ලෙසින ...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ... පටුන ...


| | පිටුව |
|---|---|
| 1) අවසර | 01 |
| 2) හෙරණගත්කරණී | 02 |
| 3) ප්‍රජාපති මගෙ නැඟණී | 04 |
| 4) වඳින පා මා අසිත | 06 |
| 5) සොයුර ඔබ බුදු වන්න | 07 |
| 6) පැරදුණ මාර දූ වරු | 09 |
| 7) විපතට කරුණු | 11 |
| 8) සමාව දෙන්නේ | 13 |
| 9) අනඳ පින්වත් දැන් නාඩන්න | 14 |
| 10)උගත මනා ශිල්පයමයි මතු රැකෙනා | 16 |
| 11)කුසලේ ම වඩන්නේ | 18 |
| 12)දූත දේවයන් | 19 |
| 13)උපදෙස් දහය | 21 |
| 14)දියුණුව නියත වේ සඳ | 23 |
| 15)දස අකුසල් | 24 |

| | |
|---|---|
| 16)දස රජ දම් | 25 |
| 17)නුවණැ යොදවන් විරිය කෙරුමට | 26 |
| 18)පියවර සංවර | 28 |
| 19)පුන් සඳ බබළයි | 29 |
| 20)තිබෙත් මහත් සාහිත රන වටින ලද | 30 |
| 21)එය යි ඔබේ මතු අගයේ | 31 |

# ***අවසර..***

මහා ගුණ කඳ දරනා
අවිදු දුක ලොවේ දුරනා
සතට සෙත සලසවනා
වදිමි තුම් බුදු රුවනා

නිසරු මඟ පෙන්නා
සරු මඟ ම දන්නා
දෙලොව සෙත කියනා
වදිමි මහ දම් රුවනා

සදහම් සිසිල බෙදනා
දහම් කෙත සරු කරනා
පින් මඟ ම වඩිනා
වදිමි මහ සඟ රුවනා

ගුණ නැත සීමා මා තුනු රුවනා
කෙලෙස වදින් දෝ ඒ ගුණ වයනා
කමා ඉලමි ගෙන දැත ම මුදුනා
කවියට අවසර පතනෙමි බැතිනා

## හෙරණගත්කරණී

නිෂ්ඵල දේ අත හැරිණ
සරු මාවත් සොයමින
රහත් ධජය දරමින
සඟ රජවරු වැඩයින

මහමැති ඇමති සෙන්පති
රජවරු මුලු රට ම දණ නැමී
පවා ඔබ සළකා වැන්දේ කුල දෙවි
දහමින් ඔවා දෙනු මැන මා හිමි

දහම් මඟ පෙන්වමිනි
හෙළ ජනට පතා සෙත්නි
රජ ඇමති ඇරයුම්ණී
සිදු විය හෙරණගත් කරණී

මහා වංශෙක අරුම ය
හංස,ලිහිණී සංදෙස් නාදය
ලෝ වැඩට හිත් වන මා කවිය
සඟ රුවනේ නැණයෙන් ලිය විය

ලෝ අන් කිසි රටක නැති

මා සාහිත අපට ඇති

සඟ රුවනේ පන් හි දිනි

ලෝ උරුමය අපට දුණී

වසර දෙදහස් ගණනි

ඒ උරුමය පැවත එනි

හෙට දරු රිසි දක්නි

රක්නා හෙරණ ගත් කරණී

## ප්‍රජාපතී මගෙ නැඟණී

සුරතල් නැඟණිය මගේ
පින්වත් බිරිය හිමිගේ
මව් නි පුත් නන්දගේ
මව් ඔබමයි දැන් ඔහුගේ

සිඟිති කාලේ සිට ම
සියලු සම්පත බෙදූ ව
එක ම කුල ගෙට ආව
සේ ම මගෙ පුතු ඔබට

ඉන්න ඔබලා සමඟ
පුතු වැඩෙනා දකින්න
කිරි දී ඔහු නළවන්න
ලෝ දහමෙන් නෑ වරම

බිහි කෙරුමෙට පින් කඳක්
පාරමී ඇති වුණා මටත්
කිරෙන් නහවා රන් කඳක්
දෙන්න ඔබ ලෝකෙට ඉරක්

ප්‍රජාපතී මගෙ නැඟණී

මහාමායා සමු ගනිමි

පුතු බුදු ව නිව්නේවි

බලා තුසිතේ ඉන්නෙමි

## වදින පා මා අසිත

කිරිකැටි සිඳුහත් පා යුගල
සිප ගත් මාගේ රැළි නළල
රජුන් පවා වැඳි මා පතල
වදින සිඟිති පා මා අසිත

හිනැහෙමි දුක නස්නා දැකපු නිසා
හඬනෙමි මගෙ දුක නොනැසෙන නිසා
රජුට ගුරුව දුන්නත් මා උප දේසා
වරම නැතේ වන්නට ඔබෙ ශ්‍රාවකයා

ලැබුවත් ලෝ ඇති මා දැහැන් මම
ලෝතුරු සුවේ තවමත් දුරයි මම
බඹ ලෝ උරුම වන බව දැනත් මම
මනු ලෝ ඉන්න කැමතී තව ටිකක් මම

නියතයි කුමර ඔබ මතු බුදු වන්න
වරම නෑ ලෝ නිවෙනා මඟ අසන්න
එනමුදු මතු භව මම නිවෙන්න
පතනිමි මට ද ආයෙත් වරමක් ලැබෙන්න

## සොයුර ඔබ බුදු වන්න

සොයුර ඔබ බුදු වන්න
මා පත්නම් මළණු වන්න
කිරි ඔබට පුද දෙන්න
කිරි මව්ට දරු වී ඉන්න

එක මව් කුස ඉප දෙන්න
වරම නැ ලෝදම එය ය
නමුදු මොන වෙනසක් ද
කිරි එරුණේ අපි දෙන්නාට

මව් ප්‍රජාපතිය අප දෙන්නාගේ
සළකයි දෙදෙනා ම වැදු විලසේ
නමුත් මගෙ සිදුහත් අයියේ
ඒ රුහිර කිරි වන නාමේ ඔබගේ

සසර දුක දුරලන්න
සව් සත නිවා සනසන්න
මටත් සැනසී නිවෙන්න
අයියෙ ඔබ බුදු වෙන්න

මා සනසාවී කිරි මාතා ඉන්න
මගෙ මව්නි අයියව සනසන්න
හෙට බුදුව මරු පරදන්න
දහම් ක්ෂීරෙන් අපව සනසන්න

නන්ද මා ඔබගේ සොයුරු
එක මවකගේ සේ හැසිරු
එගොඩ ගොස් සසර බියකරු
මටත් පෙන්වන් නිවන පියකරු

## <u>පැරදුණු මාර දූ වරු</u>

වසවතී මාරා පැරද සිටින්නේ
මාර කුමරියන් හඬමින් එන්නේ
තමනුත් පැරදුණු බව කියමින්නේ
සිදු වූ තතු මරුට කියන්නේ

රතී වයයි මිහිරෙන් නාදෙන
රගා රඟුවේ කාමුක විලසෙන
තණ්හා ගයයි කන්කලු නාදෙන
හිමි වැඩ වුන්නේ නෑසුන විලසින

කුමරි විලස අපි වෙස් රූ ගත්තා
තරුණී විලස අපි වෙස් රූ ගත්තා
මැදි කත් ලෙස අපි වෙස් රූ ගත්තා
විය කත් ලෙස අපි වෙස් රූ ගත්තා

බිරියො වෙන්න අවසර අපි පතනා
රාගී ලෙසින් අපි සංසල වෙන්නා
විරාගේ අය ළඟ නිෂ්ඵල වෙන්නා
මහා පුරුෂ හිමි නිසල ව උන්නා

තණ්හා දැලේ පැටලෙන කිසිදු
සිදුරක් නෑ දැන් හිමි ළඟ ඉතුරු
රවටනු බෑ දැන් හිමි යි සම්බුදු
නියත යි පතුරයි දම්සක් උතුරු

## විපතට කරුණු

ඇසුර බාල විපතට කරුණකි
තණ්හා බලය විපතට කරුණකි
සසර වෛර විපතට කරුණකි
මාපිය දුක ද විපතට කරුණකි

උත්තම මුණි රජුගේ සසුනේ
පිහිටි ගන්නට මුළු තුන් කෝණේ
සත් දන ඇසුර අනිවා ඕනේ
කිම් ද ඒ වග මුල ම නැසූනේ

දරු සෙනෙහෙ දැනමුත් පමානේ
නිරය උරුම පිය මැරූ නිසානේ
සමා යැද අඩමි පිය රජාණේ
පිහිට වනු මැන මා බුදු රජාණේ

ගිය කල නිසා ඇතුන්වත් යළි නො එන්නේ
දැන් කල හිතා යහපතමයි කරන්නේ
සම්බුදු සස්න වෙනුවෙන් මා දිවි පුදන්නේ
දෑත නළල බැඳ තුනුරුවන වඳින්නේ

ගෝතම මහා සම්බුදු සස්නේ
මහා සද්ධා ඇත්තා ඔහුනේ
ධම් සගීතියටත් දායක ඔහුනේ
අජාසත් රජුටත් මුල වැරදුණේ

පණ්ඩිත ඇසුර මඟුල් කරුණය
වැරදුණ පසුව හඬලා පලක් නැත
ඒ බව සිතා මහ සසරේ කෙටි වන්න
පසේ බුදුව අජාසත්නි ඔබ නිවෙන්න

## සමාව දෙන්නේ

රන් තලියක් නිසා
ගත්තෙ හදවත පලා
සසර ම වින කරනා
වෛරයක් ඇරඹුණා

ගිහි කළ වුවත් නැදෑ සුහුරා
පැවිදි වුවත් ලෙසට සව්වා
වීරි වඩලා ගතත් දැහැනා
සසර තරහ මතුම වෙන්නා

තුම් රුධිර ධාතුව සොලවාලා
සඟුන් භේදයෙන් වෙන් කරවාලා
පුතුන් බිම්සර නොමඟ යවාලා
මහා අකුසලෙන් නිරය පතාලා

බුදු හිමියනි මට සමාව දෙන්නේ
සසරෙ නැතේ අප අය හමු වන්නේ
අවසන් වදනින් බුදු හිමි සරණේ
එ පින ලබා පස් බුදු බව ගන්නේ

## <u>අනඳ පින්වත් දැන් නාඩන්න</u>

වෙසක් පොහොය පුන් සඳ පැයූ
උතුම් දිනෙකි තුම් හිරු පැයූ
එ දින නිවෙන බව හිමි ආයූ
කෙලෙස සිතණු මම සිත් වැයූ

අනඳ යන නාමෙන් අද ඉඳලා
කවුරු අමතනු මා තනි වීලා
වාවනු බැ හිමි හිත පැරිලා
රහත් නැ මානෙත් තෙත් වීලා

සල් මල් කුසිනාරා පිපෙන
මා හිමි සිරි දේහය වදින
දෙස බලමින් මට ඇඬෙන
කාට අද සිට මා වදින

සසර පුරා අග උවටැන් තැන ලබන
අදිටනින් මා ඔබ හා කෙරු පිනෙන
අවසන් භවේ මහ දම් කඳ අසන
අනඳ මම හිමි ඔබ පා අද වදින

ඔබ දම් නද අය නෑ මට ඇසෙන්නේ
හද පතුලෙන් මා උවටැන කරන්නේ
වරද වීය නම් සමාව ලැබෙන්නේ
දම් බඩගරික ඔබ පා වඳින්නේ

නැත ආනන්ද කිසි වරදක් වූයේ
ඔබෙ තුම් සෙනෙහස සසර ම වූයේ
නැසේ සැම දෑ අනියත ලෝකයේ
පොදුයි කරුණා පහදන්නයි බුදු වූයේ

අනඳ ඔබෙ දුක නිවෙන්නට
සුළු කාලයයි තව ගෙවෙන්නට
මා නිවුණා ලෙසින් නිවෙන්නට
කාලය නියමිතයි ඔබටත් ලැබෙන්නට

සසර බැඳීමක අවසානය මෙන්න
සසර පැතුමක දිනුමත් මෙන්න
නැවත නෑ කිසි බර කර ගන්න
අනඳ පින්වත් දැන් නාඬන්න

## උගත මනා ශිල්පයමයි මතු රැකෙනා

වසර ගණනකට පසු
හමු වූවා පෙරදින ගුරු
නැවුණා දන ඉබේ ගරු
කරන මා සිතින් යුතු

මා දැන් පිරිපුන් පෙනුම යුත්තේ
අපි නාකි වි යැයි ඔහු කීවේ
දැන් ජීවිතේ ගැන ඔහු ඇහුවේ
කෙසේ කියන ද පිළිතුරු නැත්තේ

එදා ඔබ වදන් මා නැත සිතූවේ
ශිල්පෙ අත හැර යෙදූ කෙළියේ
එකට වළ බැසි සකිද නැත්තේ
දිවිය වෙහෙසයි ඔහේ යන්නේ

දනිමි උපරිමෙ මා නොදුන් බව
දනිමි උපරිමෙ මා නොගත බව
හැකි නම් හරවනු ආය කාලය
අසමි ඔබෙ එදා කී වදන් පෙළ

එම වදන නම්,

"උගත මනා ශිල්පයම යි මතු රැකෙනා"

# කුසලේ ම වඩන්නේ

දුර ගමනෙ යයි තනි ව හැසිරෙයි
ගුහා සිරුරෙ නො දැනෙන්න වෙසෙයි
හැඩයක් නැත්තේ අල්ලනු බැරි වෙයි
සිත් මළ නසනට සිහිය ම අවැසෙයි

අකුණු ලෙසින් සිතිවිලි බිහිවෙයි
අකුණු ලෙසින් සිතිවිලි දුරුවෙයි
සිතෙන සෑම දේ කෙරුම කැප නොවෙයි
සිහිය ලණු පොටින් බැඳී ම යහ වෙයි

කලබල සිත වන් හතුරෙක් නැත්නේ
සංවර සිත වන් මිතුරෙක් නැත්නේ
තමා සරණ තම ඇතුළෙ ම ඇත්නේ
පමා නොවී කුසලේ ම වඩන්නේ

## <u>දූත දේවයන්</u>

මාන මදයෙන් මත් ව මේලොව
ශ්‍රවණ මව්පිය ගුණය අත්හල
පිනට දහමට නොදුන දිවිහල
නරයෙක් ගියේ නොදැන නිරයට

අල්ලා යම පල්ලා ඔහු ව
කුදලෑ ගියේ යම රජු වෙත
පින මතු වේ දැ යි විමසුමට
ඇසුවා දූත දේවයන් දුටු බවට

පස් දූත දේවයන් කිසිවෙක්
දැක නැ මම හිමිය කවරෙක්
කියා සරණක් පතා හඬමින්
උන්න ඔහු හට මෙසේ කියමින්

එම්බා නරය ඔබ පෙර
සිටිනා විටදි මනු ලොව
මහලු,මළමිණි, ලෙඩුන
දැකලා නැද්ද කිසි දින

එම්බා නරය ඔබ පෙර
සිටිනා විට දි මනුලොව
ළදරු පැටවෙක් කිසි කල
දැක නැතෑ නොකියා හොඳ

එම්බා නරය ඔබ පෙර
සිටිනා විටදි මනුලොව
අපරාධී දණ්ඩන ලබන
නොදැක සිටියා නොහැක

දූත දේව ඔබ දැකලා සත්තයි
බොට උපමාවෙන් තොර ව වසයි
මේ දණ්ඩන ඔබ කරනා පවටයි
මිසක අනෙකු නොකළා දෙයටයි

ආය මනු ලොව යත් නම්
කරනු නැ කිසි පව නම්
පිනට පමා බව දැන් නම්
දැනේ නිර හඬ පෙනේ නම්

## උපදෙස් දහය

කුල ගෙට යන දියණියට
පියා අමතා පෙර දින
කුල සිරි ගුණ රකින්නට
දුන්නේ උපදෙස් දහය බැගින

ගින්න නම් වූ ගැටලුව
කුලගේ තුළට හෝ පිටතට
දෙන්නට එපා කිසි දින
වැටහේ ද මා දියණිය

දෙන්නන්ට කෝමත් දෙන්න
නොදෙන ඇයට එපා දෙන්න
යන තැන සම්පත රකින්න
නුවණ මෙහෙයවන් දිනන්න

අසුනට පෙර යුතුකම කරන්න
අනුභව පෙර යුතුකම කරන්න
නින්දට පෙර යුතුකම කරන්න
දියණි සුවසේ ඔබ හිඳින්න

புதா கினி ஸஂஞரஹ | கரன்ன
--- | ---
புதா துளு தெவி | வதின்ன
பியா அத பஸம ய | அஸன்ன
துவ தும் விஶாபா | ரகென்ன

## <u>දියුණු ව නියත වේ සඳ</u>

නිරතුරු රැස් වීම ද
සමඟිව රැස්ව වීම ද
සමඟිව කතා කෙරුම ද
සමඟිව විසිර යෑම ද

කුල කතුන් රැකුම ද
පැන වූ නීති රැකුම ද
නොපැන වූ දේ තිබීම ද
වැඩිහිටි ඔවදන බුහුම ද

පුද ගරු බිම් රැකීම ද
සඟ හා තුමන් රැකීම ද
රටක දියුණුව සළසා ලද
අපරිහානේ දම් නම් ලද

ලිච්ඡවී රජ දරු රකින ලද
විසාලා මා නුවර රකින ලද
රජ මැති වැසි සැම රකී ලද
රටේ දියුණු ව නියත වේ සඳ

## <u>දස අකුසල්</u>

පරපණ නැසීම ද<br>
සොරකම් කිරීම ද<br>
කාමය වැරදවී ම ද<br>
මහ අකුසල් නොවෙ ද

බොරු බස් කියා රැවටීම<br>
නොසරුප් වදන කිවීම<br>
කේලාම් හිස් වදන කීම<br>
වදන වේ අකුසල කම්ම

මහා ලෝභය දැරීම<br>
මහා තරහව දැරීම<br>
මිස දුටුවත් දැරීම<br>
සිතූ අකුසල් කම්ම

දස අකුසල් දුරලන්න<br>
තිදොර සංවර කරලන්න<br>
සුගතියෙ ම හව වෙන්න<br>
නිවන් මඟ විවර වන්න

## දස රජ දම්

සළකා ජනයාට දානෙන්
කැප දිවි පරිත්‍යාගයෙන්
කය වදන සංවර කෙරෙන්
රජුන් දැහැමිව යෙහෙන් වැජඹෙන්

සෘජු මුදු ව සිට ක්‍රෝධ නොකරන්
තපසින් ඉවසුමෙන් ජීවේ ගෙවන්
අවිරෝධ නොකර හිංසා නොම කෙරෙන්
රජුන් දැහැමි ව යෙහෙන් වැජඹෙන්

භූමි භාරකරු බව තා යැයි සිතන්
මිස අයිතිකරු නොව බව සිතන්
සැම වැසි ම දරු බැව් සිතන්
රජුන් දැහැමි ව යෙහෙන් වැජඹෙන්

# <u>නුවණ යොදවන් විරිය කෙරුමට</u>

විලක් අසබඩ දිනක්
සිටී කොස්වා ලිහිණියෙක්
පීනන මාලු ඇත ගොඩක්
නමුත් අලසයි ගනී නින්දක්

අලස බව හරහට නිසත්
මාලු ගොඩ සිතු නිසත්
දිය නොසිඳ ඇති නිසත්
අලසව ම වයසින් යත්

ලිහිණි කොස්වා ද වයසයි
විලේ ජලයත් සිඳ යයි
මාලුන් ද මිය යයි
පෙර දොස් අනේ සිහි වෙයි

වියපත් ව යන තුරු ම
සිට ඔහේ අලසව ම
දං පින් ධන නොගෙන ම
සිටින ලිහිණි වේ ඔහු ම

ප්‍රිය දියුණු තුම් මිනිසාට

මී කුණක් ඇති බවට

සිහි නුවණේ තිය හොඳට

නුවණ යොදවනු විරිය කෙරුමට

## පියවර සංවර

පැළඳ සූ සැට අබරණ
රජුන් බැස වීදි දිවෙන
සැරසි හස්ති මගුල් දුවන
ශෝභ නැත විට දකින

හිමි සිවුර උත්තම දරන
කත මව් තැනට සම වන
වීදි බැස දිව යන සමයෙන
නැත ශෝභ පිරිස එය නරඹන

යුධ වැද දිනූ දඹදිව් තලය
දුක් ව සිටි අශෝක නිරිඳුය
මන බැන්ද පියවර සංවරය
සාමණේර ඒ සත් හැවිරිදිය

ලෙසට හිංසා අනුනට වන්නා
මාවත යාම නොහො බින්නා
තම සුවය ද විය හැක අගුණා
සුවය රකියි පෙර සිහි යන්නා

# <u>පුන් සඳ බබළයි</u>

අංගුලිමාල ඇඟිලි මාලා බැන්ද
අංගුලිමාල මාහිමි සැම වැන්ද
වූයේ පසකලා සිදු කළ වරද
තේරූ සත් මඟ නිසා නොවී අන්ධ

අම්බපාලි නගර මත් කළ
මාතු වී පුත් සඳක් බිහි කළ
නිසරු සසරෙ සියලු අත් හළ
දියණී වී මුණී සසුනෙ පින් කළ

පමාව විය හැක සැම ජීවිතේ
පමා වෙන් මිදී මයි කළ යුත්තේ
එදින මිදුණා ලෙස කලු වළාවේ
පුන් සඳ බබළයි තරු පිරි අහසේ

## <u>තිබෙත් මහත් සාහිත රන වටින ලද</u>

වියත් වුවත් පෙර පඬිදුන් ලියන ලද
විියත් නොවුත් පෙර හදවත් කියන ලද
තිබෙත් අරුත් මහ විසිතුරු රටා ලද
තිබෙත් මහත් සාහිත රන වටින ලද

කියත් යමක් රසවත් වූ උපමා ය
අසත් යමක් රසවත් වූ ඉඟි වැකි ය
යටත් නොවුත් වහරක වූ තෙද පා ය
හඬත් ළමුන් නළවන ගී නැළවිලි ය

දෙදහස් පන්සිය වසරක පැවතෙන
හෙළයක වත ගොත ලොවට ම කියමින
බොදු වත ආසිරි ලැබ මා හැඟියෙන
ලොව අග බබළයි අප මහ වංසෙන

පෙර ඇත්තා පැළ කරපු නිසා
අද ඇත්තා සාහිත එල නෙළයි රසා
හෙට ඇත්තා සාහිත රස හිමිය නිසා
අද ඇත්තා සාහිත රුක රැකිය මිසා

## ***<u>එයයි ඔබේ මතු අග යේ...</u>***

බොහෝ දෙනෙකු එළිය විඳින
අඳුර නසන තිරයෙ පහන
දල්වන ලද තිරයෙ එදින
ගිනිකූර වී දැවුණ නිසන

යමකු හිසට විඳින සෙවණ
සිසිල සදන මහඟු සෙවණ
උළු වීලා යමකු සිටින
නිසයි සියලු කටොලු දරන

යමකු වැවෙන් දිය බීලා
පිපාසයට තිත තබලා
යයි මුහුදට ආ වඩාලා
එපා වැවට යයි ඇඩීලා

නිදහස ඔබ භුක්ති විඳින
ඉගෙනුම ඔබ ලබා ගන්න
පෙර දින වෙත ඔබට දෙන්න
බොහෝ දෙනෙක් දිවිය දුන්න

බොහෝ දෙනෙක් පෙර දිනයේ
නොදුටු ඔබට පෙම් කෙරුයේ
ලොවට යමක් දී යනුයේ
එයයි ඔබේ මතු අග යේ

***...නිමි...***

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්